සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

62 S I

දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

පුරවැසි අධ්‍යාපනය - I
Civic Education

පැය එකයි
One hour

විභාග අංකය ..............................

**සැලකිය යුතුයි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ 'X' ලකුණ යොදන්න.**

(01) ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,
1. රාජ සභාව  2. පුරවැසි සභාව
3. මන්ත්‍රී සභාව  4. සෙනෙට් සභාව

(02) ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ආරම්භක ක්‍රියාවලිය කුමක් ද?
1. ඉංග්‍රීසි විප්ලවය  2. ප්‍රංශ විප්ලවය
3. රුසියන් විප්ලවය  4. ඇමෙරිකන් විප්ලවය

(03) ප්‍රජාතන්ත්‍රවාදය, පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ,
1. මහජන කැමැත්ත මත පාලනය සිදුවන නිසා ය.
2. මිනිස් අයිතිවාසිකම්වලට ගරු කරන නිසා ය.
3. පාලනයේ දී සාකච්ඡා කිරීම සිදුවන නිසාය.
4. සමානාත්මතාව ගරු කරමින් පාලනය කරන නිසාය.

(04) ඒක පක්ෂ ක්‍රමය පවතින රටකට නිදසුනක් වන්නේ මින් කවරක් ද?
1. උතුරු ඇමෙරිකාව  2. ප්‍රංශය
3. ඉන්දියාව  4. උතුරු කොරියාව

(05) ශ්‍රී ලංකාව බෙදා ඇති මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණ ද?
1. 9  2. 16  3. 22  4. 25

(06) නැගෙනහිර පළාතට අයත් මැතිවරණ දිස්ත්‍රික්කය වන්නේ,
1. කෑගල්ල  2. අනුරාධපුර  3. දිගාමඩුල්ල  4. වන්නි

(07) මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම්
1. නිදහස ය.  2. සමානාත්මතාවය ය.
3. වගකීම් ය.  4. අයිතිවාසිකම් ය.

(08) ප්‍රජාතන්ත්‍රවාදී රටක පාලනය සිදුවීම පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ව්‍යවස්ථාදායක කටයුතු පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් කරයි.
2. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව රටේ පාලනය සිදු කරයි.
3. පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වන ලෙස පාලනය සිදු කරයි.
4. නීතියේ ආධිපත්‍යය සැමට ලැබෙන සේ පාලනය සිදු කරයි.

(09) "එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක්' යන සංකල්පය මත පදනම් වූයේ,

1. ජාත්‍යන්තර රාජ්‍යය වේ. 2. සමාජවාදී රාජ්‍යය වේ.
3. ජාතික රාජ්‍යය වේ. 4. පැසිස්ට්වාදී රාජ්‍යය වේ.

(10) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක සඳහන් පිළිතුර කුමක් ද?

1. එංගලන්තය හා ජර්මනිය 2. එංගලන්තය හා ප්‍රංශය
3. ඕස්ට්‍රේලියාව හා පෘතුගාලය 4. ඉතාලිය හා ජර්මනිය

(11) මධ්‍යම ආණ්ඩුව මඟින් පවරා දෙනු ලබන පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ කවර රාජ්‍යය තුළ ද?

1. ඒකීය රාජ්‍යයන් 2. සන්ධීය රාජ්‍යයන්
3. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් 4. ප්‍රබල රාජ්‍යයන්

(12) අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය විධායකය ලෙස කටයුතු කරනු ලබන්නේ කුමන ආණ්ඩුක්‍රමයක් තුළ ද?

1. රාජාණ්ඩු 2. සමූහාණ්ඩු 3. ජනාධිපති 4. පාර්ලිමේන්තු

(13) දෙවන ජනරජ ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාවේ ජනාධිපති තෝරා පත් කර ගනු ලබන්නේ,

1. මහ මැතිවරණයෙනි 2. ජනමත විචාරණයෙනි
3. ජනාධිපතිවරණයෙනි 4. කැබිනට් මණ්ඩලයෙනි

(14) අධිකරණයේ සංකේතය ලෙස නිරූපණය කර ඇති දෙවඟන වන්නේ.

1. සියුස් ය 2. ඇතීනා ය 3. එන්ලිලී ය 4. මිනර්වා ය

(15) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම

1. බලය බෙදා හැරීමයි 2. බලය විමධ්‍යගත වීමයි
3. බල අරගලයයි 4. බලය ලබා ගැනීමයි

(16) ස්විට්සර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වන සුවිශේෂ නාමය කුමක් ද?

1. ප්‍රාන්ත 2. මණ්ඩල 3. කැන්ටන් 4. මහා මණ්ඩල

(17) ක්‍රි.ව. 1865 මහ නගර සභා ආඥා පනත යටතේ පිහිටි වූ ප්‍රථම මහ නගර සභාව වන්නේ,

1. කොළඹ 2. ගාල්ල 3. මහනුවර 4. යාපනය

(18) ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම සම්බන්ධයෙන් සඳහන් වන්නේ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ කී වන පරිච්ඡේදයෙන් ද?

1. 13 2. 15 3. 17 4. 19

(19) පළාත් සභාවක ප්‍රධාන ඇමතිවරයා පත් කරනු ලබන්නේ කවරෙකු විසින් ද?

1. ජනාධිපති 2. අගමැති
3. කථානායක 4. ආණ්ඩුකාරවරයා

(20) පළාත් සභාව සතු ප්‍රධානතම කාර්යය වන්නේ,

1. ප්‍රඥප්ති සකස් කිරීමයි
2. ප්‍රඥප්ති සකස් කිරීම හා සම්මත කිරීම යි
3. යටිතල පහසුකම් සංවර්ධන කිරීමයි
4. අයවැය ලේඛනය සම්මත කිරීමයි

(21) පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය කුමක් ද?

1. සෙනෙට් සභාව
2. ප්‍රාදේශීය සභාව
3. විධායක සභාව
4. මහා සභාව

(22) ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත රාජ්‍යවලට හිමි බලතල ඇතුළත් පිළිතුර වන්නේ කවරක් ද?

1. මූල්‍ය කටයුතු හා නිවාස
2. විදේශ කටයුතු හා විදේශ වෙළඳාම
3. පළාත් පාලනය හා අධ්‍යාපනය
4. සෞඛ්‍ය හා බදු පැනවීම

(23) බහු සංස්කෘතික බව හොඳින් ප්‍රයෝජනයට ගෙන ඇති රටකට නිදසුනක් වන්නේ,

1. සිංගප්පූරුව යි
2. ප්‍රංශයයි
3. ඉන්දියාවයි
4. කැනඩාවයි

◆ **24 - 25 ප්‍රශ්න සඳහා පහත වාක්‍ය උපයෝගී කරගන්න.**

A නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම
B යටිතල පහසුකම් සංවර්ධනය
C තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීම
D නිදහසේ ගමනාගමනය
E වෘත්තිය සමිති පිහිටුවා ගැනීම

(24) එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවයට ගරු කිරීමේ වැදගත් බව පෙන්වා දෙන ප්‍රකාශ වන්නේ,

1. A හා B වේ.
2. A හා C වේ.
3. B හා E වේ.
4. E වේ.

(25) ඉහත ප්‍රකාශ අතුරින් ආර්ථික අනන්‍යතාවයට ගරු කිරීමේ වැදගත්කම දක්වෙනුයේ කවර ප්‍රකාශවලින් ද?

1. B හා C වේ.
2. D හා E වේ.
3. B හා E වේ.
4. A හා C වේ.

(26) යහපාලනය යන්න පිළිබඳ දක්වෙන නිවැරදි වගන්තිය මින් කුමක් ද?

1. අනවශ්‍ය ආකාරයට බලය මධ්‍යගත වූ පාලනයකි.
2. විනිවිද භාවයෙන් නිලධාරීවාදය ක්‍රියාවට නංවන්නකි.
3. රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.
4. නීතිගරුකව වගවීමෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලියකි.

(27) බ්‍රිතාන්‍ය පාලන සමයේ වතු වගාව සඳහා ශ්‍රමිකයන් ලෙස දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනයා ගෙන්වීම ශ්‍රී ලංකාවේ,

1. සංස්කෘතික විවිධත්වයට හේතු විය.
2. සංක්‍රමණ ඇති වීමට හේතු විය.
3. වෙළඳ බලය තහවුරු කිරීමට හේතු විය.
4. සමාජ සාධාරණත්වය බිඳ වැටීමට හේතු විය.

(28) ලෝකයේ සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීමට බලපා ඇති හේතුවක් නොවන්නේ,

1. ගෝලීයකරණය
2. සන්නිවේදන තාක්ෂණයේ දියුණුව
3. සංචාරක ව්‍යාපාරයේ දියුණුව
4. ධනවාදයේ දියුණුව

(29) "නිදහස" යන්න පිළිබඳ අදහස් දක්වූ චින්තකයෙක් නොවූයේ මින් කවරෙක් ද?

1. ටී. බී. ටයිලර්
2. ඒබ්‍රහම් ලින්කන්
3. ජී. ඩී. එච්. කෝල්
4. මහාචාර්ය ගානර්

Remove Watermark Now

(30) රාජ්‍යයකට පැවරෙන මූලික කාර්යයකි.

1. පරිපාලන බලතල ක්‍රියාත්මක කිරීම
2. නීතිය හා සාමය ආරක්ෂා කිරීම
3. ජනතා කැමැත්ත තීරණය කිරීම
4. යුක්තිය පසිඳලීමට කටයුතු කිරීම

(31) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සමාන අයිතිවාසිකම් හිමිවීම,

1. සමාජ ගැටුම් අවම වීමට හේතු වේ.
2. පාලනය ක්‍රමවත් වීමට හේතු වේ.
3. යුතුකම් ඉටු කිරීමට හේතු වේ.
4. පෞද්ගලික කුසලතා වර්ධනයට හේතු වේ.

(32) පළාත් සභාවකට අවශ්‍ය මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණය කිරීමට බලපාන සාධක වන්නේ,

1. වර්ග ප්‍රමාණය හා ආණ්ඩුව
2. ජනගහනය හා දිස්ත්‍රික්ක සංඛ්‍යාව
3. ජනගහනය හා වර්ග ප්‍රමාණය
4. ස්වාධිපත්‍ය හා භූමිය

(33) පළාත් සභාවක නාමික විධායකය ලෙස කටයුතු කරනු ලබන්නේ,

1. ආණ්ඩුකාරවරයා
2. ජනාධිපතිවරයා
3. මහ ඇමතිවරයා
4. මහ ඇමති හා ඇමති මණ්ඩලය

(34) ඒකීය ආණ්ඩුක්‍රමයක නීති පැනවීම සම්බන්ධ බලය හිමි උත්තරීතර ආයතනය කුමක් ද?

1. පාර්ලිමේන්තුවයි
2. අධිකරණයයි
3. මහා සභාවයි
4. සෙනෙට් මණ්ඩලයයි

(35) ශ්‍රී ලංකාවේ බලතල විමධ්‍යගත කිරීමේ දී පහළම මට්ටමේ සිටින නිලධාරියා වන්නේ,

1. අමාත්‍යාංශ ලේකම්
2. ප්‍රාදේශීය ලේකම්
3. ග්‍රාම නිලධාරි
4. දිස්ත්‍රික් ලේකම්

(36) රාජ්‍යයකින් ජන සමාජයට ඉටුවිය යුතු වගකීමක් වන්නේ මින් කවරක් ද?

1. රටේ සම්පත් සාධාරණව බෙදී යන සේ කටයුතු කිරීම
2. දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් බිහි කිරීම
3. වංචා දූෂණවලින් යුතු සමාජයක් බිහි කිරීම
4. යහපාලනයක් ගොඩනැගෙන සේ කටයුතු කිරීම

(37) පුද්ගලයින්ගේ බාහිර චර්යාවන් පාලනය කිරීම සඳහා රජය විසින් පනවනු ලබන රීති සමුදාය ........................... නම් වේ

1. රීති
2. නීති
3. සිරිත් විරිත්
4. ආචාර ධර්ම

(38) ශ්‍රී ලංකාව අතීතයේ දී බලය බෙදා හැරීමට ගත් උත්සාහයක් වන්නේ,

1. දිස්ත්‍රික් සංවර්ධන සභා ඇති කිරීම
2. ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම
3. ග්‍රාමෝදය මණ්ඩල ක්‍රියාත්මක කිරීම
4. මැග්නාකාර්ටා ගිවිසුම ඇති කිරීම

(39) සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා පැවතිය යුතු ගුණාංගයක් වන්නේ මින් කවරක් ද?

1. සියලු ජන කොටස් පොදු හැඟීමෙන් කටයුතු කිරීම
2. මධ්‍යම ආණ්ඩුවට වාසි වනසේ සෑම විටම කටයුතු කිරීම
3. මූල්‍ය ගනුදෙනුවල දී මධ්‍යම ආණ්ඩුවට වාසි සහගත ලෙස කටයුතු කිරීම
4. ආර්ථික තීන්දු ගැනීමේ වගකීම ප්‍රාන්තවලට පැවරීම.

(40) තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමයක් පවතින විට දැකිය හැකි යහපත් ලක්ෂණ ඇතුළත් පිළිතුර කුමක් ද?

1. ජන සමාජයේ විවිධත්වය නිරූපණයට අවස්ථා නොවීම
2. අත්තනෝමතික පාලනයක් බිහි නොවීම
3. නියමිත කලට මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය නොවීම
4. ප්‍රාදේශීය සංවර්ධනයක් සිදු නොවීම.

(ලකුණු 01 x 40 = 40

Remove Watermark Now

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

62 | S | II

දෙවන වාර පරීක්ෂණය, 2018 ජුලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

පුරවැසි අධ්‍යාපනය - II
Civic Education

පැය දෙකයි
Two hours

විභාග අංකය ..............................

සැලකිය යුතුයි.

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01) i. ග්‍රීක පෞර රාජ්‍යවල පාලනයට සහභාගී කර නොගත් කණ්ඩායම් දෙකක් නම් කරන්න.

ii. ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ "වජ්ජි" ජනපදය පාලනයේ දී අනුගමනය කළ වර්තමානයේ දී ද දැකිය හැකි සප්ත අපරිහානිය ධර්ම දෙකක් ලියන්න.

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් අත්වන වාසි දෙකක් ලියන්න.

iv. පරමාධිපත්‍ය බලය තුළ අන්තර්ගත අංග දෙකක් සඳහන් කරන්න.

v. සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් දෙකක් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

vi. ජන සමාජයේ දක්නට ලැබෙන සංස්කෘතියට අයත් අංග දෙකක් නම් කරන්න.

vii. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික ජන සමාජයක් ඇති වීමට බලපෑ වෙළඳාම් සඳහා පැමිණි ජාතීන් දෙකක් නම් කරන්න.

viii. ජාතික රාජ්‍යයක ලක්ෂණ දෙකක් ලියන්න.

ix. පළාත් සභාවක මහ ඇමති සහ ඇමති මණ්ඩලය සතු කාර්යයන් දෙකක් ලියන්න.

x. බහු සංස්කෘතික ජන සමාජයක පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

02) i. අතීතයේ සිට ලෝකයේ රාජ්‍යයන් භාවිත කළ පාලන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. වර්තමාන රාජ්‍යයන් සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ක්‍රියාත්මක නොකිරීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03) i. ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කිරීම සඳහා භාවිත කරන නිර්ණායක දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04) i. වර්තමාන රාජ්‍යයන්හි දැකිය හැකි ආණ්ඩුක්‍රමවල ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ව්‍යවස්ථාදායකය සතු කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. අධිකරණයෙන් ඉටුකරන කාර්යයන් තුනක් සඳහන් කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

Remove Watermark Now

(05) i. බලය විමධ්‍යගත කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02

ii. ඒකීය රාජ්‍යයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03

iii. නූතන රාජ්‍යයන්හි බලය බෙදා හැරීමට හේතු වූ කරුණු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05

(06) i. නිදහසින් පසු ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා ගත් ප්‍රයත්නයන් දෙකක් ලියන්න (ලකුණු 02

ii. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක සමගාමී ලැයිස්තුව සතු බලතල තුනක් සඳහන් කරන්න. (ලකුණු 03

iii. ස්විස්ටර්ලන්තයේ සන්ධීය රාජ්‍යයක් බිහිවීම කෙරෙහි බලපෑ සාධක තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) i. ''සංස්කෘතිය'' පිළිබඳ අදහස් ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)

ii. රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වාසි පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

papers.lk
pdfelement